මුදල්,කුම සම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

**සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය**

# කාර්යාලයක් සඳහා ගොඩනැගිල්ලක් බද්දට හෝ කුලියට ලබාගැනීම

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය එහි කොළඹ කොටුව චෙක්පත් රැස් කිරීමේ මධ්‍යස්ථානය ස්ථාපිත කිරීම සඳහා කොළඹ 01 ප්‍රදේශය ආශ්‍රිතව සුදුසු ගොඩනැගිලි පරිශ්‍රයක් කල්බදු පදනම මත ලබා ගැනීමසඳහා මුද්‍රා තබන ලද මිල ගණන් කැඳවයි.

| **ලංසු අංකය** | **ප්‍රදේශය** | **වර්ග අඩි ප්‍රමාණය** |
|---|---|---|
| ETF/PROC/A/2025/050 | කොළඹ 01 නගර සීමාවේ ප්‍රධාන මාර්ගයකට යාබදව | අවමය වර්ග අඩි 700 |

**<u>මූලික අවශ්‍යතා /තිබිය යුතු පහසුකම් -</u>**

01. බදු ගිවිසුම් කාලය වසර 2ක් සඳහා වන අතර,පසුව වාර්ෂිකව කාලය දීර්ඝ කිරීමට සලකා බලනු ලැබේ.

02. ගොඩනැගිලි සැලසුමට අදාල පලාත් පාලන ආයතනයේ අනුමැතිය ලබා තිබිය යුතුය.

03. ගොඩනැගිල්ලට අදාල ලේඛනයන්හි නීත්‍යානුකූල මුල්පිටපත් මණ්ඩලය විසින් ඉල්ලූ විට ඉදිරිපත් කිරීමේ හැකියාව තිබිය යුතුය.

04. පානීය නල ජලය, තෙකලා විදුලිය,දුරකතන සහ මූලික සනීපාරක්ෂක පහසුකම් තිබිය යුතුය

05. වාහන 03 හෝ වැඩි ප්‍රමාණයක් නැවැත්වීමේ පහසුකම් තිබිය යුතුය.

06. සේවා ලාභීන්ට පොදු ප්‍රවාහන සේවා මගින් පහසුවෙන් ළඟාවීමට හැකි ස්ථානයක් විය යුතුය.

07. උඩුමහලක් තිබෙන ගොඩනැගිලි සඳහා විදුලි සෝපානය තිබීම අමතර සුදුසුකමක් වේ.

08. වායුසමීකරණය කර තිබිය යුතුය.

09. විදුලි ජනක යන්ත්‍රයක් තිබීම අමතර සුදුසු කමක් ලෙස සැලකේ.

මේ සඳහා කැමැත්තක් දක්වන ලංසුකරුවන් හට සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ <u>www.etfb.lk</u> දරණ වෙබ් අඩවියට පිවිසීමෙන් ලංසු ලේඛන ලබාගත හැක. සම්පූර්ණ කරන ලද ලංසු ලේඛන (Bidding Document) **<u>2025.06.04 දින උදේ 10.30</u>** ට හෝ ඊට පෙර නාරාහේන්පිට, මෙහෙවර පියස ගොඩනැගිල්ලේ, 23 වන මහලේ පිහිටි ප්‍රසම්පාදන අංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටි අංක <u>08</u> ට බහාලිය යුතුය. ලියුම් කවරයේ වම්පස කෙලවරහි ටෙන්ඩර් අංකය සහ "කොටුව කාර්යාලය සඳහා ගොඩනැගිල්ලක්" යනුවෙන් සඳහන් කල යුතුය.

වැඩි විස්තර සහකාර සාමාන්‍යාධිකාරී (දායක මුදල් රැස්කිරීම්)
දුරකතන අංක : 011 7747265 ඇමතීමෙන් ලබාගත හැක.

සභාපති - ප්‍රසම්පාදන කමිටුව / ප්‍රධාන විධායක නිලධාරී
සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය
තැ.පෙ. 807, 23 වන මහල, මෙහෙවර පියෙස, නාරාහේන්පිට, කොළඹ 05